# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2187/2 - 2020 අගෝස්තු මස 03 වැනි සඳුදා - 2020.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/2/3.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ (2) (ඇ) අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවෙන් සහ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තියෙන් මා වෙත පැවරී අති බලතල ප්‍රකාරව, අංක 2165/8 හා 2020 මාර්තු මස 02 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින්, 2020 මාර්තු මස දෙවැනි දින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මකවන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැර 2020 අප්‍රේල් මස 25 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාපත්කර ගැනීමේ දිනය වශයෙන් ද, 2020 මැයි මස 14 වන දින අභිනව පාර්ලිමේන්තුව රැස්වන දිනය වශයෙන් ද, ප්‍රකාශයට පත්කරන ලද හෙයින් ද,

තව ද, කොවිඩ් - 19 වසංගත තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (3) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියා කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාපත්කර ගැනීමේ මැතිවරණය පැවැත්වෙන දිනය 2020 අගෝස්තු මස 05 වශයෙන් 2179/17 හා 2020 ජුනි මස 10 දිනැති *ගැසට් නිවේදනයෙන්* ප්‍රකාශ කරන ලද හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ (2) (ඇ) අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2020 අගෝස්තු මස 20 වන දින අභිනව පාර්ලිමේන්තුව කැඳවනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වර්ෂ දෙදහස් විස්සක් වූ අගෝස්තු මස 03 වන දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.